ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ගැසට් පත්‍රය
2023 ජූලි මස 28 වන දින
**II** වන කොටස
අතිරේකය
(2023.07.28 දින නිකුත් කරන ලදී)

# ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන)

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 | තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි නීතිය බලපෑම වනුයේ වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩි කිරීම වේ.

එල්.ඩී.— ඕ. 4/2023

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2023 අංක  දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1979 අංක 51 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඈ) ඡේදයේ, "රේගු අයකැමිවරයා; සහ" යන වචන වෙනුවට "රේගු අයකැමිවරයා;" යන වචන ආදේශ කරනු ලැබීමෙන්;

(2) එහි (ඉ) ඡේදයේ "නම් කරනු ලබන නියෝජිතයෙක්." යන වචන වෙනුවට "නම් කරනු ලබන නියෝජිතයෙක්; සහ " යන වචන ආදේශ කරනු ලැබීමෙන්;

(3) එහි (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේදය එකතු කරනු ලැබීමෙන්:-

"(ඊ) වරාය සහ නාවික කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්.".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.